**හිමිකම් රක්ෂණ අරමුදල - 2021**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

හිමිකම් රක්ෂණ අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන,ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින්2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවසත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධපාලනය කරනපාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශනශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධවපරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද,අවස්ථාවෝචිතවඋචිතවිගණනපරිපාටිසැලසුම්කිරීමපිණිසඅභ්‍යන්තරපාලනයපිළිබඳවඅවබෝධයක්ලබාගන්නාලදී.

- භාවිතාකරනලදගිණුම්කරණප්‍රතිපත්තිවලඋචිතභාවය, ගිණුම්කරණඇස්තමේන්තුවලසාධාරණත්වයසහකළමනාකරණයවිසින්කරනලදසම්බන්ධිතහෙළිදරව්කිරීම්අගයනලදී.

- සිද්ධීන්හෝතත්ත්වයන්හේතුවෙන්අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍යප්‍රකාශනවලව්‍යුහයහාඅන්තර්ගතයසඳහාපාදකවූගනුදෙනුහාසිද්ධීන්උචිතහාසාධාරණවඇතුළත්වීඇතිබවසහහෙළිදරව්කිරීම්ඇතුලත්මූල්‍ය ප්‍රකාශනවලසමස්ථඉදිරිපත්කිරීමඅගයනලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම්අදාළලිඛිතනීතියකටහෝඅරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,අරමුදල ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත්සකසුරුවම්ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

**------------------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | ----------------- | -------------------- | ---------------------- | --------------- |
| **(අ)** | | 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග | | | |
| | (i) | අංක 42(ආ) | හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් සති 02කට වරක් හිමිකම් ආදායම් සම්බන්ධ වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ලබාදිය යුතු වුවද, විගණන වාර්තාවේ දිනට 2021 වර්ෂය සඳහා ලබා නොදුන් වාර්තා ගණන 94කි. | ඇතැම්හිමිකම් කාර්යාල විසින් අදාළ වාර්තා ලබා නොදීම නිසා මෙම තත්ත්වය වාර්තා වී ඇත. | ආදායම් නිවැරදිව වාර්තාකල යුතුවීම. |
| | (ii) | අංක 42 (ඉ) | සෑම දින 14ක් අවසානයේදීම හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් එකතු කර ගන්නා මුදල් හිමිකම් පිළිබද රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ප්‍රධාන මුදල් පොතට වෙන් වශයෙන් හර කල යුතු වුවද, සියළුම හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලයන්හි දෛනික ආදායම්වල එකතුවක් සෑම දිනකම මුදල් පොතට හර කර තිබුණි. | බැංකු වාර්තා අනුව එක් එක් කාර්යාල වශයෙන් ඇතුළත් කිරීම ප්‍රායෝගික වශයෙන් අපහසු වී ඇත. | -එම- |
| | (iii) | අංක 42 (ඌ) (4) | සෑම මාසයක අවසානයේදීම හිමිකම්රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ මුදල් පොතේ හෝ බැංකු ගිණුමේ කිසිඳු ශේෂයක් නොතිබිය යුතු වුවද, 2021 වර්ෂයේ මැයි, ජූලි හා අගෝස්තු මාසයන්හි පිළිවෙලින් රු.270, රු.9,000 හා රු.203,800 බැහින්මුදල් පොතේ ශේෂයන් පැවතුණි. | 2021 වර්ෂයේ මැයි මස ආදායම අඩුවෙන් ගිණුම්ගත වීම, ජූලි මාසයේ රු.9,000ක් අඩුවෙන් චෙක්පතක් ලියා තිබීම සහ අගෝස්තු මාසයේදී රු.203,800ක හඳුනා නොගත් මුදලක් වාර්තා වීම මේ සඳහා හේතු වී ඇත. | යොමුගත නියෝගයට අනුගත විය යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2019/(I) (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 02 ඡේදය | අවම වශයෙන් කාර්තුවකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක්වත් පැවැත්විය යුතු වුවද 2021 වර්ෂයේදී එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට අවස්ථාවක් නොලැබීම නිසා මෙම තත්ත්වය වාර්තා වී ඇත. | යොමුගත නියෝගයට අනුගත විය යුතු වීම. |

## 1.6 ආයෝජන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී මුදලින් කල ආයෝජන හා ආයෝජන කල්පිරීමෙන් ලද මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කිරීම වෙනුවට 2020 දෙසැම්බර් 31 දිනට අරමුදල සතු මුළු ආයෝජන වටිනාකම වූ රු.97,189,304ක් මුදල් ගලා ඒම් ලෙස ද 2021 දෙසැම්බර් 31 දිනට එම වටිනාකම වූ රු.109,581,704ක් මුදල් ගලායාම් ලෙස ද සටහන් කර තිබුණි. භාණ්ඩාගාර බැඳුම්කර ගිණුම අනුව 2021 වර්ෂය තුළ  මිලදී ගත් බැඳුම්කර වටිනාකම රු.29,946,394ක් වූ අතර 2021 වර්ෂය තුල දී කල් පිරුණු බැඳුම්කර වටිනාකම රු.16,834,600ක් විය. | 2021.01.01දිනට භාණ්ඩාගාර බැඳුම්කරවල වටිනාකම රු.97,189,303ක් වන අතර වර්ෂය තුළදී නව ආයෝජනය කිරීම් රු.29,946,394ක් වේ.වර්ෂය තුළදී කල් පිරෙන බැඳුම්කරවල වටිනාකම රු.16,834,600ක් වි ඇත. | ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කළ යුතු වීම. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.21,449,550ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.18,201,794ක් විය. ඒ අනුවමූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,247,756ක වර්ධනයක්නිරීක්ෂණය විය. මෙම වර්ධනයට හිමිකම් ලියාපදිංචිකිරීමේ ආදායම රු.2,583,976කින් වැඩි වීම හා භාණ්ඩාගාර බැඳුම්කර පොළී ආදායම රු. 757,354 කින් වැඩිවීම  ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යාල 5ක නියැදි පරික්ෂාවට අනුව කාර්යාල 3ක් විසින් (ගම්පොල, මාතලේ හා මාතර) ප්‍රධාන කාර්යාලයට එවන ලද හිමිකම් ආදායම පිළිබඳ වාර්තා2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි | අදාළ ලේඛනය පවත්වාගෙන යාම සඳහා දින 15කට වරක් වාර්තාවක් ලබාදෙන ලෙස ඉල්ලා ඇතත් නියමිත පරිදි | යොමුගත නියෝග වලට අනුකූල විය යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග 42(ආ) හා (ඇ)ප්‍රකාරව "ආර්.ජී.ටී/අයි.එෆ් 03" ආකෘතියට අනුකූල නොවුවද කළමනාකරණය විසින් නිවැරදි ආකෘතිය සහිත වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සියලුම වාර්තා ලබාගැනීමට අපහසු වී ඇත. | |
| (ආ) | ප්‍රධාන කාර්යාලයට හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් ලැබෙන වාර්තා ඇතුලත් කිරීමට යථෝක්ත නියෝග අංක 42 (ආ) ප්‍රකාරව ආකෘති අංක "ආර්.ජී.ටී./අයි.ඒෆ්. 02" අනුව ලේඛනයක් නඩත්තු කල යුතු වුවද, එම ලේඛනයද අදාල ආකෘතිය ප්‍රකාරව සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | ආකෘති පත්‍ර ආර්/ජී.ටී/අයි.එෆ්.02 හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් එකතු කරගත් මුදල් පිළිබඳ වාර්තාවක් වන අතරහිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල සියලුම ආදායම් පිළිබඳව තොරතුරු ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත.එම වාර්තා ඇසුරින් ප්‍රධාන කාර්යාලය විසින් වාර්තාවක් පිළියෙල කරන අතරසියලුම වාර්තාවන් නොලැබීම නිසා අදාළ වාර්තාව නිවැරදිව යාවත්කාලීන කිරීමට නොහැකි වී ඇත . | යොමුගත ආකෘතියට අනුකූල විය යුතුවීම. |
| (ඇ) | අරමුදලේ කාර්යයන් වෙනුවෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු පරිශ්‍රය හා එහි සම්පත් භාවිතා කරනු ලැබුවද,ඒ සඳහා වැය වන විදුලිය, ජලය හා දුරකථන වියදම් අරමුදලේ පරිපාලන වියදම් තුළ ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අරමුදලේ කාර්යයන් සිදුකිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු පරිශ්‍රය සහ සම්පත් භාවිතා කරනු ලබන අතර රක්ෂණ අරමුදලේ කාර්යයන් වෙනමම ගණනය කිරීම ප්‍රායෝගිකව අපහසු කටයුත්තක්බව කළමනාකරණ මණ්ඩලය දැනුවත් කර ඇත. | වියදම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුවීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සෑම මසකම හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම් වාර්තා තුළ එකතුව රු.6,292,564ක හඳුනානොගත් ආදායමක් පවතින බැවින් එම ආදායම කුමන කරුණක් සඳහා ලැබුණේද යන්න හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාල විසින් සති 02ට වරක් ආදායම් වාර්තාවක් ලබා දෙන අතරසමහර කාර්යාල විසින් අදාල වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා මෙම තත්ත්වය වාර්තා වී ඇත. | නිවැරදි ආදායම් ගිණුම් ගත කළ යුතුවීම. |
| (ඉ) | ඉකුත් වර්ෂයේදී විගණනය විසින් පෙන්වා දෙනු ලැබූ වරද නිවැරදි කිරීම ශුද්ධ වත්කම් ප්‍රකාශයේ ගැලපීමට කටයුතු නොකර එම ගැලපීම් කිරීමෙන් පසු ශේෂය සමුච්චිත අරමුදලේ ආරම්භක ශේෂය රු.91,409,664ක් ලෙස ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ දක්වා තිබුණි. | 2019වර්ෂයේදී රෙජිස්ට්‍රාර්ජනරාල්ගේ ගිණුමට බැර විය යුතු මුදලක්, වැරදීමකින් හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ගිණුමට බැර වී තිබීම නිසා, හිමිකම් රක්ෂණ අරමුදල් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසුව 2021 වර්ෂය ආරම්භයේ දී නිවැරදි කර ගිණුම් වල නිවැරදිව ගලපා ඇත. | මූල්‍ය ප්‍රකාශනවලට නිවැරදිව දත්ත ඇතුලත් කළ යුතු වීම. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------------- | ----------- |
| **(අ)** | 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඉඩම්වල අයිතිය ලියාපදිංචි කිරීමේදී අයිතිය සම්බන්ධයෙන් වැරදි තීරණයක් ගැනීම හේතුවෙන් පාර්ශවකරුවන්ට සිදුවන අලාභ සඳහා රජය විසින් වන්දි ප්‍රදානය කිරීම අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වුවද, එම අරමුණට අදාළ කිසිදු කාර්යයක් ක්‍රියාකාරි සැලැස්ම තුල ඇතුලත් කර නොතිබුණු අතර අරමුදල ආරම්භ වූ 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු හානිපූර්ණ වන්දි මුදලක්ද ගෙවීම්කර නොතිබුණි. | හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් පොදු ජනතාව දැනුවත් කිරීමේ කටයුතු ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් සිදු කරයි. හිමිකම් රක්ෂණ අරමුදල මඟින් වන්දි ලබාදීම තීරණය කරනු ලබන්නේ අධිකරණය මඟින් වන බැවින් වන්දි ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට කරුණු ඇතුළත් කිරීමට නොහැකිවී ඇත. | අරමුදලේ මූලික අරමුණ සාක්ශාත් කර ගැනීමට කටයුතු කළ යුතුවීම. |
| **(ආ)** | 2021 වර්ෂයේදි හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් හිමිකම් සහතික 37,558ක් ලියාපදිංචි කර තිබුණු අතර අරමුදල ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිකුත් කල මුළු සහතිකපත්‍රප්‍රමාණය 746,416ක් විය. | 2021වර්ෂයේ ලියාපදිංචි ඉඩම් කැබලි ප්‍රමාණය 37,558ක් වන අතර හිමිකම් ලියාපදිංචි කිරීම ආරම්භ කළ දින සිට 2021.12.31දින දක්වා ඉඩම් කැබලි746,416ක් ලියාපදිංචි කර ඇත. | ප්‍රමාණාත්මක කාර්යසාධන මට්ටමක් පවත්වාගෙන යාම. |